මගේ අංකය : ස.ජ/ප්‍රගති/ප්‍ර.කා.ප.නි/අ.ස්.මාරු/2019
ස.ජ.කාර්යාලය,
කොළඹ.
2018.11.12

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්/
අධ්‍යක්ෂ (මැසිආ)/ජ්‍යෙ.නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්/
පළාත් සර්වේයර් ජනරාල්වරුන් / නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්
ජ්‍යෙ.මිනින්දෝරු අධිකාරීවරුන්/මිනින්දෝරු අධිකාරීවරුන්/
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරි / කාර්මික හා පරිපාලන නිලධාරීන්
අදාල අංශ ප්‍රධානීන් වෙත.

## 2019 වර්ෂයේ අභ්‍යන්තර ස්ථාන මාරු
## ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරීන් සහ සිතියම් තාක්ෂණ නිලධාරීන්

2019 වර්ෂය සඳහා සර්වේයර් ජනරාල් කාර්යාලයට අනුයුක්ත කර ඇති සියලුම ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරීන් හා සිතියම් තාක්ෂණ නිලධාරීන් සර්වේයර් ජනරාල් කාර්යාලයේ එක් එක් ශාඛාවලට අනුයුක්ත කිරීම සඳහා පැවැත්වෙන අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය වෙත 2018.11.28 දිනට පෙර තම ඉල්ලීම් මේ සමඟ ඇති ආකෘති පත්‍රය අනුව අනිවාර්යයෙන්ම ඉදිරිපත් කරන ලෙස සියලුම ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරීන් සහ සිතියම් තාක්ෂණ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

02. ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරීන්ගේ සහ සිතියම් තාක්ෂණ නිලධාරීන්ගේ 2019 අනුයුක්ත කිරීම් පිළිබඳ විස්තර 22/2018, 26/2018 කාර්ය මණ්ඩල චක්‍රලේඛ ලිපි මගින් දැනුම් දී ඇති අතර එම නිලධාරීන්ගේ ස්ථාන මාරු අභියාචනා පිළිබඳ තීරණ ඉතා ඉක්මනින් ලබා දීමට කටයුතු කරනු ඇත. අභියාචනා ඉදිරිපත් කළ නිලධාරීන් ඒ පිළිබඳ තීරණ ලද විගස අවශ්‍යතාවය අනුව අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම් කළ යුතුය.

03. ප්‍රධාන කාර්යාලයේ සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්/ ජ්‍යෙ.නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්/ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්/ ජ්‍යෙ.මිනින්දෝරු අධිකාරීවරුන් විසින් තමා යටතේ ඇති එක් එක් ශාඛාවල 2018 වර්ෂයේ සේවය කරන ලද ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරීන් සහ සිතියම් තාක්ෂණ නිලධාරීන්ගේ නාම ලේඛනයක් ශාඛාවේ සේවය කළ කාලයද 2019 වර්ෂයට අනුයුක්ත කළ යුතු ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරීන්/ සිතියම් තාක්ෂණ නිලධාරීන් සංඛ්‍යාව ද සමග 2018.11.28 දිනට පෙර ප්‍රගති අංශයට එවීමට ද කරුණාකර කටයුතු කරන්න. 2018 වසරේදී ඔබගේ අංශයේ සේවය කරන නිලධාරීන් 2019 වසරේදී ද එම අංශයටම අනුයුක්ත කළ යුතු නම් ඒ බව ද සඳහන් කරන්න.

පී.එම්.පී. උදයකාන්ත
සර්වේයර් ජනරාල්

පී.එම්.පී. උදයකාන්ත
සර්වේයර් ජනරාල්

## 2019 වර්ෂයේ අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම් පත්‍රය -
## ජ්‍යෙෂ්ඨ සිතියම් තාක්ෂණ නිලධාරීන්/සිතියම් තාක්ෂණ නිලධාරීන්

1. මුලකුරු සමග නම - .......................................................................... මහතා / මිය / මෙනවිය

2 සේවා අංකය : ..............................

3. ශ්‍රේණිය හා එයට පත් වූ දිනය - .ශ්‍රේණිය.................... එයට පත් දිනය ..........................

4. දැනට සේවය කරන ස්ථානය / ශාඛාව -...............................................

5. එම ස්ථානයට වාර්තා කළ දිනය -..........................................

6. 2019 වර්ෂයේදි ප්‍රධාන කාර්යාලයේ සේවය කිරීමට කැමති ශාඛාව - (ප්‍රමුකත්වය අනුව)

   1............................................................
   2............................................................
   3............................................................

7. සිතියම්කරණයට අදාල මෘදුකාංග භාවිතය පිළිබඳ දැනුම:

| මෘදුකාංගයේ නම | භාවිතයට ඇති හැකියාව | | |
|---|---|---|---|
| | සතුටුදායකයි | හොඳයි | ඉතා හොඳයි. |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

8. ඔබ දැනටමත් ප්‍රධාන කාර්යාලයේ සේවය කරන්නේ නම් පසුගිය වසර 10 හි සේවය කල ස්ථාන පිළිබඳ විස්තර

| වර්ෂය | සේවය කළ ශාඛාව/කාර්යාලය | වර්ෂය | සේවය කළ ශාඛාව/කාර්යාලය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

ඉහත විස්තර නිවැරදි බව සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන : .......................... දිනය :......................

අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය : .............................................................................................

අත්සන : ...................................... දිනය :......................

මාණ්ඩලික නිලධාරියාගේ නිර්දේශය : .............................................................................................

අත්සන.................................... දිනය : ......................